EXAMRESULTS.LK

(17)

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

තෙවන වාර පරීක්ෂණය - 2022 (2023)

Third Term Test – 2022 (2023)

| 10 ශ්‍රේණිය Grade 10 | ගෘහ ආර්ථික විද්‍යාව - I | කාලය පැය තුනයි. අමතර කියවීම් කාලය මි. 10 යි |
|---|---|---|

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණු යොදන්න.

---

01. මහා පෝෂක ලෙස හඳුන්වනු ලබන්නේ,
1. ප්‍රෝටීන්, විටමින්, ජලය 2. ප්‍රෝටීන්, විටමින්, කාබෝහයිඩ්‍රේට
3. ඛනිජ ලවණ, විටමින්, කාබෝහයිඩ්‍රේට 4. ප්‍රෝටීන්, මේදය, කාබෝහයිඩ්‍රේට

02. සැකරයිඩ අණු 1 ක් සහිත කාබෝහයිඩ්‍රේටය හඳුන්වන්නේ,
1. පොලිසැකරයිඩ 2. මොනොසැකරයිඩ 3. ඩයිසැකරයිඩ 4. මින් කිසිවක් නොවේ.

03. ග්ලයිකොජන් අඩංගු වන්නේ,
1. උක්සීනිවලය. 2. ආටිචොක්වලය. 3. සත්ව පිකුදුවලය. 4. කිරි ආහාරවලය.

04. කාමර උෂ්ණත්වයේදී ද්‍රව අවස්ථාවේ පවතින ලිපිඩ හඳුන්වන්නේ,
1. තෙල් 2. මේදය 3. ද්‍රව 4. ලිපිඩ

05. කිරි හා කිරි ආහාරවලට උදාහරණයකි.
1. යෝගට් 2. බටර් 3. ලාඩ් 4. මාගරින්

06. විටමින් E හි රසායනික නාමය වන්නේ,
1. කැරොටින්ය. 2. ටොකොෆෙරොල්ය. 3. පැන්ටතනික් අම්ලය 4. ඇස්කොබික් අම්ලය

07. ධාන්‍ය හා මාෂ බෝග මිලදී ගැනීමේදී ඒවායේ තිබිය යුතු සුවිශේෂී ලක්ෂණයක් විය යුත්තේ,
1. මෘදු වයනය 2. තෙත් බව 3. වියළි බව 4. ඔපවත් බව

08. තන්තුමය ආහාර වේලක් ඇතුළත් කර ගැනීමෙන් වළක්වා ගත හැකි බෝ නොවන රෝගයක් වන්නේ,
1. ඇදුම 2. ආන්ත්‍රික පිළිකා 3. පැපොල 4. සරම්ප

09. යීස්ට්වල ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය උෂ්ණත්ව ප්‍රමාණය වන්නේ,
1. $35^0$ C 2. $38^0$ C 3. $40^0$ C 4. $27^0$ C

10. ආහාරයෙහි වයනය, රසය හා පෙනුම වැනි ලක්ෂණ ලබා ගැනීම සඳහා ආහාර පිළියෙළ කිරීමේ ක්‍රියාකාරකමකි.
1. පදම් කිරීම 2. මිශ්‍ර කිරීම 3. කලවම් කිරීම 4. ස්ටූ කිරීම.

11. ආහාර වේලක විවිධත්වය ඇති කරනුයේ,
1. සුවඳ, රුචිකත්වය, වර්ණය, වයනය මගිනි.
2. වර්ණය, වයනය, රසය, සගන්ධය මගිනි.
3. රුචිකත්වය, සගන්ධය, රසය, වර්ණය මගිනි.
4. වර්ණය, වයනය, රසය, රුචිකත්වය මගිනි.

12. අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ලයක් නොවන්නේ,
1. ලියුසින් 2. ආර්ජිනින් 3. ලයිසින් 4. සෙයින්

13. වියළි තාපයේ පිසීමේ ක්‍රමයක් නොවන්නේ,
1. කබලේ පිළිස්සීම. 2. රෝස්ට් කිරීම.
3. බේක් කිරීම. 4. ස්ටූ කිරීම.

14. අයඩීන් ඌණතාවය නිසා යොවුන් වියේදී ඇතිවන රෝගී තත්ත්වයකි.
1. ක්‍රෙටිනතාව 2. මන්ද බුද්ධික බව
3. මික්සොඩීමා 4. අස්ථි මාර්දවය

15. විශේෂ අවස්ථා සඳහා ආහාර වේල් පිළිගැන්වීමෙන් ඔබට සැලසෙන වාසියකි.
1. මුදල් ඉතිරි වේ. 2. අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය වේ.
3. උත්සවය දැකගැනීමට හැකිවේ. 4. කම්මැලි නොවේ.

16. ඔරලෝසු මුහුණතේ කටු කැරකෙන දිශානුගතව යමින් ආහාර පිළිගන්වනු ලබන්නේ,
1. ඇමරිකන් ක්‍රමවේදයටය. 2. ඉංග්‍රීසි ක්‍රමවේදයටය.
3. ජර්මන් ක්‍රමවේදයටය. 4. ප්‍රංශ ක්‍රමවේදයටය.

17. ආහාරයක අඩංගු ක්ෂුද්‍ර ජීවීන්ගේ වර්ධනය හා එන්සයිම ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රයෝජනයට ගත හැකි ජල ප්‍රමාණය හඳුන්වන්නේ,
1. ජල සක්‍රියතාවය ලෙසය. 2. විජලනය ලෙසය.
3. ජල අඩු සක්‍රියතාවය ලෙසය. 4. වියළි සක්‍රියතාවය ලෙසය.

18. ජීවන චක්‍රය තුළ වැදගත් සන්ධිස්ථානයක් හා උපරිම වර්ධන වේගයක් පෙන්නුම් කරන අවධිය වන්නේ,
1. ළදරු අවධිය 2. මල් යොවුන් විය.
3. නව යොවුන් විය. 4. මැද යොවුන් විය.

19. ලෝක සෞඛ්‍ය සංවිධාන අනුමැතියට අනුව යොවුන් විය හඳුන්වන වයස් පරාසය වනුයේ,
1. අවු: 10-19 2. අවු: 10-24 3. අවු: 17-19 4. අවු: 14-16

20. ප්‍රතිශක්තිය ඇති කිරීමෙහිලා බලපාන මව්කිරිවල අඩංගු ද්‍රව්‍යයකි.
1. කොලෙස්ටරෝල් 2. ප්‍රොලැක්ටින් 3. ඉන්සියුලින් 4. කොලෙස්ට්‍රම්

21. ස්‍යුනිකා උත්තේජන හෝර්මෝනය ස්‍රාවය වන්නේ,
1. තයිරොයිඩ් ග්‍රන්ථියෙනි 2. ස්වේද ග්‍රන්ථියෙනි
3. පිටියුටරි ග්‍රන්ථියෙනි 4. පුරස්ථි ග්‍රන්ථියෙනි

22. යොවුන් වියේ සිදුවන කායික වර්ධනයට අයත් වන්නේ,
1. අවස්ථාවෝචිත හැසිරීම් රටාව 2. අත් පා කඳට වඩා වේගයෙන් වර්ධනය වීම.
3. කැපී පෙනීමට ඇති කැමැත්ත 4. ස්වාධීනත්වය කරා යාම.

23. මාතෘ සායනයකදී මුල් දිනයේදී සිදු කරන පරීක්ෂණයක් වනුයේ,
1. උස මැනීම. 2. බර මැනීම. 3. රුධිර පරීක්ෂණය 4. මුත්‍රා පරීක්ෂණය

24. ගර්භනී මවකට ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පිළිබඳ තීරණය කරනු ලබන පරීක්ෂණය වනුයේ,
1. මුත්‍රා පරීක්ෂණයයි. 2. රුධිර පීඩනය මැනීමයි.
3. රිසස් සාධකය මැනීමයි. 4. VDRL පරීක්ෂණයයි.

25. යොවුන්වියේ දරුවන්ගේ චිත්තවේග ප්‍රකාශයෙහි ස්වභාවයක් වනුයේ,
1. බියපත් බව 2. සන්සුන් බව 3. ස්ථිර බව 4. ක්ෂණික බව

26. ආර්තව චක්‍රය තුළ පරිණත ඩිම්බයක් මුදා හැරීම හඳුන්වනුයේ,
1. ඩිම්බ මෝචනය නමිනි. 2. ආර්තවහරණය නමිනි.
3. මල්වර වීම නමිනි. 4. අධිරෝපණය නමිනි.

27. ගැහැනු දරුවෙකුගේ යොවුන් වියේදී සිදුවන ලිංගික ලක්ෂණයක් නොවනුයේ,
1. උස හා බර වැඩිවීම. 2. උරහිස් පළල්වීම
3. උකුල පළල් වීම. 4. සිරුරේ හැඩය වෙනස්වීම.

28. ගර්භණීභාවය සඳහා ඉතා සුදුසු වයස් සීමාව වනුයේ,
1. අවු: 15-20 ත්ය. 2. අවු: 20-30 ත්ය.
3. අවු: 30-35 ත්ය. 4. අවු: 20-35 ත්ය.

29. පවුලක් තුළින් සපුරා ගත හැකි මානසික අවශ්‍යතාවයකි.
1. අධ්‍යාපනය 2. ආදරය 3. ආහාර පාන 4. ඇඳුම් පැළඳුම්

30. මින් සාමාජයීය අවශ්‍යතා ගණයට අයත් වන්නේ,
1. නිවාස 2. සහයෝගය 3. සෞඛ්‍යය 4. රැකවරණය

31. ප්‍රසන්න පවුලක දක්නට ලැබෙන ලක්ෂණයක් නොවන්නේ,
1. කලහකාරී බව 2. ත්‍යාගශීලී බව 3. බෙදා හදා ගැනීම. 4. ආරක්ෂිත බව

32. නිවාස සැලසුම් ඇඳීමේදී දිග හා පළල ප්‍රමාණය කුඩා කර දැක්වීම හඳුන්වනුයේ,
1. පරිමාණය නමිනි. 2. රාශිකරණය නමිනි. 3. සංකේත නමිනි. 4. අවකාශය නමිනි.

33. භූමියක වටිනාකම රඳාපවතිනුයේ,
1. අවට පරිසරය මතයි. 2. ජීවත්වන වටපිටාව මතයි.
3. ඔප්පුවේ නිරවුල් බව මතයි. 4. යටිතල පහසුකම් මතයි.

34. උපාංගයක් නිර්මාණය කිරීමට ප්‍රථම තීරණය කළ යුතු කරුණු ඇතුළත් දළ සැලැස්ම හඳුන්වනුයේ,
1. නිර්මාණ සැලසුමයි. 2. පිරි සැළසුමයි.
3. නිර්මාණ එකතුවයි. 4. විවිධාංගීකරණයයි.

35. රෙදි පිරියම් කිරීමේ ක්‍රමයක් නොවන්නේ,
1. රෙද්දෙහි ඇද ඇරීම. 2. රසායනික ද්‍රව්‍යයක් යෙදීම.
3. රැළි ඉවත් කිරීම. 4. ස්ත්‍රික්ක කිරීම.

36. ළදරු ඇඳුමක් නිර්මාණය කිරීමේදී අනුගමනය කළ යුතුපියවර පිළිවෙළින්,
1. රෙදි පිරියම් කිරීම, කැපීම, මැදීම. 2. රෙදි තෝරා ගැනීම, පිරියම් කිරීම, කැපීම
3. පතොරම රෙද්ද මත තබා කැපීම, මැසීම 4. රෙදි පිරියම් කිරීම, පතොරම් රෙද්ද මත තබා කැපීම, මැසීම.

PAST PAPERS WIKI